# චක්‍රවර්ති සිංහනාද
# සූත්‍ර ධර්ම දේශනය

දේශකයාණෝ
අති පූජ්‍ය ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

ධර්ම දානය පිණිසයි

# චක්‍රවර්ති සිංහනාද
# සූත්‍ර ධර්ම දේශනය

© : අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමි.

ධර්ම දානය පිණිස පමණි.

**විමසීම් :- 0702204851**

ධර්ම දානය සඳහා මුද්‍රණ විමසීම්.

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.
දුර: 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑල: dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්: www.dhammadanabooks.com

## පෙරවදන

සක්රුවනේ ආනුභාවයෙන් ගුවනින් ගමන් යන, සතර මහද්වීපයට අගරජ වන නිති පන්සිල්, පොහොය, අටසිල් රකින සප්තරත්නයෙන් සමන්විත දසරාජ ධර්මයේ පිහිටා සිටින, දැහැමි රජවරු සක්විති රජවරු නමින් හැඳින්වෙති.

''දළ්හනේමි'' නම් වූ සක්විති රජකෙනෙකු මුල් කොට ඇති අතීත ප්‍රවෘතියක් ද ඇතුළත් කොට, තුන් කාලයක් එක්කොට ලෝකයාගේ පිරිහීමත්, දියුණුවත් පහයමින්, මතු බුදුවන මෛත්‍රී සම්බුද්ධ ශාසනයත්, ''සංඛ'' නම් සක්විති රජතුමාත් හඳුන්වමින් දේශනා කරන ලද්දාවූ දීඝනිකායේ 25 වෙනි දීර්ඝ සූත්‍ර දේශනාව '' චක්‍රවර්ති සිංහනාද සූත්‍ර දේශනාව '' නමින් හැඳින්වේ.


ලෝක සත්වයාගේ අකුසල් උත්සන්න වීමෙන් ලොවෙහි ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා සහිත සකල සම්පත් පිරිහීමත්, කුසල් උත්සන්න වීමෙන් දියුණුවත්, සැලසෙන ආකාරය පැහැදිලි කරමින් තම තමාට පිහිටක්, පිළිසරණක් කරගන්නා සැටිත්, ධර්මය තමාට පිහිටක් පිළිසරණක් කරගන්නා පිළිවෙලත් මෙම චක්‍රවර්ති සූත්‍ර දේශනාවෙහි වදාරා ඇත.

බුදු බණ දෙසීම, උගැන්වීම, ලියවීම, මුද්‍රණය කරවා බෙදා දීම යනාදි වශයෙන් ධර්මය විවෘත කිරීම සියළුම ආමිස දානයන් අභිබවා මුදුනටම යන ධර්ම දානයකි. සන්තති මහ ඇමති සූසැට අබරණ දරා සිටම එක් ගාථා මාත්‍රයකින් බුදුබණ පදයක් ඇසූ කෙනෙහි අරහත්වයට පත්වූයේ, පූර්ව ජාතීන්හිදී ධර්ම දානය පිරිනැමූ අනුහසිනි.

මෙම ධර්ම දානමය පින්කම සඳහා සහ සම්භන්ධ සෑම දෙනාට සම්බුදු සසුනෙහි උදාර ලෙස ගුණ පිළිවෙත් දියුණු කර ගැනීමටත් ශාන්ති ලක්ෂණ නිර්වාණාවබෝධය පිණිසත් හේතු වේවා…!

මේ දහම් පොත මුද්‍රණය සඳහා දායකත්වය දැරූ පින්වත් සැමටත් දිමුතු මුද්‍රණාලාධිපතිතුමා ප්‍රධාන සැමටත් ,මෙය කියවන, භාවිතා කරන සියළුම දෙනාටත් දෙලොව දියුණුවත්, කෙළවර අමාමහ නිවන් සුව අත්වේවා….!

මෙයට මෙතැති,
නා උයනේ අරියධම්ම ස්ථවිර
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම.



**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

**අත්තදීපාභික්ඛවේ විහරථ අත්ථ සරණා**
**අනඤ්ඤ සරණා ධම්ම දීපා ධම්ම සරණා**
**අනඤ්ඤ සරණා කථඤ්ච භික්ඛවේ භික්ඛු**
**අත්තදීපෝ හෝති අත්ත සරණෝ**
**අනඤ්ඤ සරණෝ ධම්ම දීපෝ ධම්ම සරණෝ**
**අනඤ්ඤ සරණෝ**

ඉධ භික්ඛවේ භික්ඛු කායේ කායනුපස්සි විහරති, ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දොමනස්සං වේදනාසු -පෙ-චිත්තේ-පෙ-ධම්මෙසූ ධම්මානුපස්සි විහරති. ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, ඒවං ඛෝ භික්ඛවේ භික්ඛු අත්තදීපෝ විහරති අත්ත සරණෝ අනඤ්ඤ සරණෝ. ගෝචරේ භික්ඛවේ චරථං සකේ පෙත්තිකේ විසයේ. ගෝචරේ භික්ඛවේ චරථං සකේ පෙත්තිකේ විසයේ නලච්ඡති මාරෝ ආරම්මණං, කුසලාණං භික්ඛවේ ධම්මානං සමාදානහේතු ඒවම්දං පුඤ්ඤං පවඩ්ඪතීති.

**ශ්‍රද්ධාවන්ත පින්වතුනි !**

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවතුන් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ දීඝ සූත්‍රයක මාතෘකා පාඨයක් ධර්ම දේශනාව සඳහා ඉදිරිපත් කරන්න යෙදුනෙ මෙම සූත්‍රය හඳුන්වන්නේ චක්‍රවර්ති සිංහ නාද සූත්‍රය නමින් දීඝ නිකායේ තිබෙන මෙම 25 වන චක්‍රවර්ති සිංහ නාද සූත්‍රය අතිවිස්ථාර වූ නමුත් වේලාවේ පමණින් ඉතා කෙටි සාරංශයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙම දේශනාව මෛත්‍රි වර්ණනාව අනාගත වංශ දේශනාව සඳහන්වන ඉතා වැදගත් සූත්‍රයක් මෙම දේශණය ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළේ චාරිකා ගමනක් වඩින අතර මගදි ''මාතුල'' කියන ජනපදයේදීයි.
බුදුරජාණන් වහන්සේගේ චාරිත්‍රයක් තිබුණා වස් වැස නිමවා මහා සඟරුවන පිරිවරා ගෙන ජනපද චාරිකාවේ වැඩම කිරීම. ඇතැම් අවස්ථාවන්හිදී භික්ෂුන් වහන්සේලා විසිදහස් ගණනක් ගමනට සම්බන්ධ වෙනවා. එක් අවස්ථාවක මගධ රාජධානියෙහි ජනපද චාරිකාවක වැඩම කරත්දි ''මාතුල'' කියන දනව්වට වැඩියා. ''මාතුල'' දනව්ව අභියස වනාන්තරයක සේනාසන පහසුකම්ද තිබුණා. ''මාතුල'' ජනපදවාසී බෞද්ධයෝ අතිශයින්ම

තුණුරුවන් කෙරෙහි ප්‍රසාදයට පත් පිරිසක් බැවින් එදා සවස් කාලයේ ඔවුන් බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ නමස්කාරයෙන් පසු දින බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට ආරාධනා කොට තම තමන්ගේ කටයුතු කර්මාන්ත පසෙක තබා සියල්ලොම එකමුතුව දාන සංවිධානයේ යෙදුනා. මුළු රාත්‍රිය පුරාම විශාල මණ්ඩපයක් ඉදිකරලා ප්‍රණීත දාන වස්තු සම්පාදනය කරලා පසුදින උදෑසන කාලය දැනුම් දුන්නා පිඬුසිඟා වඩින සේක්වා කියලා. බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය පාත්‍ර චීවර ධරව ශාන්තව මෙම දාන ශාලාවට වැඩම කරල වත් පිළිවෙත් පිලිගෙන දානය වැළඳුවා. ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ එදින අලුයම් කාලයේදී මහා කරුණා සමාපත්තියෙන් නැගී බුදු ඇසින් ලොව බලද්දි දැන ගත්තා විශාල පිරිසක් මාර්ගඵල නිවන් දකින දවසක් බව. එසේ නමුත් මේ දාන ශාලාව ධර්ම දේශනා කිරීමට සුදුසු තැනක් නොවෙයි. මහ ජනතාවට වාඩිවෙන්න ඉඩ පහසුකම් නැති බැවින් උන්වහන්සේ දානය වළඳලා පාත්‍රය රැගෙන ආසනයෙන් නැගී සිට පිටත් වී වැඩම කළා මහා සංඝයාද පිටත් වුණා. මහා සඟපිරිස එදා විසි දහසක් වැඩ සිටියා. බුදුරජාණන් වහන්සේ මගධ ක්ෂේත්‍රය දක්වා වැඩම කළා. මේ මහ ජනතාවද කල්පනා කළා වෙන දවස්වල බණ පදයක් අපට අහන්න ලැබෙනවා. අද අපේ දාන සංවිධානයේ යම් කිසි අඩුපාඩුවක් වෙන්නට ඇති ලැබුණු තැනකදි සමාව ගන්නෙමු කියලා. පසුපසින්ම මේ පිරිසද ගියා බුදුරජාණන් වහන්සේ වැඩම කරවා වදළේ මගධ ක්ෂෙත්‍රයේ මාතුල කියන වෘක්ෂය සමීපයටයි. එතැනට වැඩම කරලා නැගෙනහිර දිශාව බලා පැනෙව්ව ආසනයේ භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියා. මහා සංඝයාද පිටුපසින් දේදුන්නක හැඩයට පේළි පෙළි විසි දහසක් දෙනා වහන්සේද වැඩ සිටියා. ඉදිරිපසින් සැදැහැවත් බෞද්ධයෝ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ද වාඩිවුණා. අහස පුරා සුදෝ සුදු වලාකුළු ඇවිත් වියන් ඇද්දාක් මෙන් සෙවන දුන්නා. හාත් පසින් සීතල සුළඟ හමමින් සැනසිම ඇති වුණා. මේ අවස්ථාවේදී සර්වඥයන් වහන්සේ අතීත, අනාගත, වර්තමාන තුන් කාලයම අලලා ඉතා වැදගත් ධර්ම දේශනයක් පවත්වා වදාළා. එම දේශනය තමයි චක්‍රවර්ති සිංහ නාද සූත්‍රය. එම දේශනයේ මාතෘකාව දීර්ඝ වුනත් අපි කෙටියෙන් ඒ ගැන සලකා බලමු.

අත්තදීපා භික්ඛවේ විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා

මහණෙනි, තමාම තමාට පිහිටක් කොටගෙන, පිළිසරණක් කොට ගෙන වාසය කරව්. ධර්මය පිහිටක් කොටගෙන,

පිළිසරණක් කොට ගෙන, වාසය කරව්, අන් සරණක් පිහිටක් නොසොයව්.

කතඤ්චපන භික්ඛවේ භික්ඛූ අත්තදීපෝ හෝතී අත්ත සරණෝ අනඤ්ඤ සරණෝ ධම්ම දීපෝ ධම්ම සරණෝ අනඤ්ඤ සරණෝ

මහණෙනි, භික්ෂු,භික්ෂුණී, උපාසක, උපාසිකා යන කවර හෝ බෞද්ධයෙක් තමාට තමා පිහිටක් කරගන්නේ, ධර්මයම තමාට පිහිටක් කරගන්නේ කෙසේද?

ඉධ භික්ඛවේ භික්ඛූ කායේ කායානුපස්සි විහරති ආතාපි සමපජානෝ සතිමා විනෙය්‍ය ලොකේ අභිජ්ඣා දෝමනස්සං

මහණෙනි, මාගේ ශාසනයෙහි භික්ෂු,භික්ෂුණී, උපාසක, උපාසිකා යන කවර හෝ බෞද්ධයෙක් කායානුපස්සනාව වඩනවා නම් එසේ වේදනා -චිත්ත- ධම්මානුපස්සනා වඩවනවා නම් එතුලින් තමයි තමාම තමාට පිහිටක් කර ගන්නේ ධර්මයම තමාට පිහිටක් කර ගන්නේ අන් සරණක් පිහිටක් නොසොයන්නේ.

ගෝචරේ භික්ඛවේ චරථ සකේ පෙත්තිකේ විසයේ

මහණෙනි, තමාගේ පියා සතු ඉඩමේ හැසිරෙනවා.

ගෝචරේ භික්ඛවේ චරතං සකේ පෙත්තිකේ විසයේ නලච්ඡති මාරෝ ඕතාරං නලච්ඡති මාරෝ ආරම්මණං

මහණෙනි, තමාගේ පියා සතු ඉඩමේ හැසිරෙනවා නම් කවර කලෙකවත් කෙළෙස් මාරයාට සිදුරක් අරමුණක් ලැබෙන්නේම නැහැ.

කුසලානං ධම්මානං භික්ඛවේ සමාදාන හේතු ඒව මිදං පුඤ්ඤං පවඩ්ඪතීති.

මහණෙනි, කුසල ධර්මයන් මනාව සමාදන්ව ගැනීමෙන් ලෞකික වූද, ලෝකෝත්තර වූද, පුණ්‍ය ඵලය මෙසේ වැඩෙනවා කියන කරුණ මෙම සූත්‍රයෙන් පැහැදිලිව දේශනා කළා.

මෙම මාතෘකාව ඉදිරිපත් කරලා සර්වඥයන් වහන්සේ පළමුවෙන්ම ධර්මශ්‍රවනය කරන පිංවතුන්ගේ සිත් සමාධිගත කරනු පිණිසත් අනිත්‍යතා මනසිකාරයක් ඇති කරවනු පිණිසත්

අතීත සිදුවීමක් ඉදිරිපත් කළා.

ඒ කුමක්ද? කාශ්‍යප බුදු සසුන පිරිහිලා සත්ව විනාශයක් සිදු වුනාට පසුව නැවත ලෝකවාසීන් කුසල් කිරීම නිසා ඔවුන්ගේ ආයුෂ වැඩි වුණා. අසංඛ්‍යය දක්වාම ආයුෂ වැඩිවෙලා නැවතත් ටිකෙන් ටික බැහැගෙන ඇවිත් පරමායුෂ අසූදහට තිබෙන කාලයේදී චක්‍රවර්ති රජවරු මේ මනුලොව හිටියා එයින් දළ්හනේමි කියන සක්විති රජතුමා තමන්ගේ අමාත්‍ය කෙනෙකුට නියම කළා..... අමාත්‍යතුමනි, මාගේ දිව්‍යමය චක්‍රරත්නය අහසේ තිබෙන තැනින් උස ප්‍රමාණයට පහත් උනොත් මට කියන්න කිව්වා…

ඉතිං මේ ඇමතිතුමාද ඒ චක්‍රරත්නයේ උස මැන ගැනීමට දෙපැත්තෙන් විශාල යකඩ කඳන් දෙකක් හිටවලා යකඩ කූරු දෙකක් එහි මට්ටමට සවිකරලා තිබුණා. අවුරුදු දහස් ගණනාවක් ගතවුණාට පසුව මෙම දිව්‍යමය චක්‍රරත්නය තිබුණු තැනින් උස ප්‍රමාණයට පහත් වුණා. අමාත්‍යතුමා මේ බව රජතුමාට කිව්වාම ඔහුට තෑගි බෝග දීලා වැඩිමහල් පුතණුවන්ට ඔටුනු පළඳවල තමන් තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යාන වැඩුවා. දින හතකින් මෙම චක්‍රරත්නය අතුරුදහන් වුණා. ඉන් පසුව අභිනවයෙන් ඔටුණු පළන් රජතුමා පිය තවුස්තුමා වෙත ගොස් වැඳලා සක්විතිවත් දහය ඉගෙන ගෙන ඒ අනුව පිළිවෙත් පුරා පසුව සක්විති සැපතට පත් වුණා. ඒ සක්විති රජතුමාද තමාගේ අර චක්‍රරත්නය තිබුණු තැනින් පාත් වුණාම පියරජතුමාසේම වැඩිමහල් පුත්‍රයාට ඔටුණු පළඳවල තමන් පැවිදි වෙලා තවුස් දම් පිරුවා. මේ ආකාරයෙන් පරම්පරා හතක්ම ගතවුණා. ඉන් පසුව අටවන රාජකුමාරයා තමන්ගේ පියා පැවිදි වුණාට පස්සේ සක්රුවන් අතුරු දහන් වූණාට පස්සේ පියතුමා (තාපසතුමා) වෙත ගියේ නැහැ. අනුශාසනා ලබන්න. තමාගේ සිය කැමැත්තෙන් රාජ්‍ය අනුශානා කළා.

ඒ පියතුමාද ධ්‍යාන වඩා ආයු කෙළවර බඹලොව උපන්නා. මේ අභිනව රජතුමා සක්විති රජ නොවී සිටිය බැවින් රටේ යම් යම් දුර්භික්ෂතාවන් ඇති වුණා. ඉන්පසු රටවැසියෝද එකතුවෙලා රජතුමාට පැමිණිලි කළා. දේවයන් වහන්ස ඔබ වහන්සේගේ පිය මුතු පරම්පරාව සක්විති රජ දරුවෝ ඔබ වහන්සේ විසිනුත් ඒ සක්විතිවත් පිරුවොත් ඔබ වහන්සේටත් හැකියාව තිබෙනවා. සක්විති රජ වෙන්න. දේවයන් වහන්ස අපි දන්නවා. ඒ සක්විති වත් දහය. රට වැසියෝ රජතුමාට කියල දුන්න. එම වත් දහය එසේ නමුත් මේ රජතුමා ඒවා පිළිගත්තට අංගසම්පූර්ණව

පිරුවේ නැහැ. එම දහයෙන් නමයක්ම සම්පූර්ණ කළා. එකක් සම්පුර්ණ කළේ නැහැ. දිළින්ඳන්ට ධනය දිය යුතු යැයි කියන වත පිරුවේ නැහැ.

ඒ හේතුවෙන් පිටිසර බද පෙදෙස්වල දුර්භික්ෂ ඇතිවීමෙන් දිළිඳුකම වැඩිවුණා. දිළිඳුකම් වැඩිවීමෙන් සොරකම් වැඩිවුණා. සොරුන් අල්ලාගෙන ආවාම ඔවුන්ට තෑගි බෝග පිරිනමල ඒ සොරු පිටත් කරලා යැවුවා. මෙසේ වාර කීපයක් කළාම නැතිබැරි මනුෂ්‍යයෝ හිතුවා හොඳම වැඩේ තමයි සොරකම් කිරීම. එයට හේතුව සොරකම් කළාම රජ්ජුරුවන් ගෙන් තෑගි බෝග ලැබෙනවා නේද කියලා. සොරකම වැඩිවුණා.

අන්තිමේදී රාජ දණ්ඩනය පැනෙව්වා බඩුත් සමග සොරුන් අසුවුනා නම් අත් දෙක පිටු පසට තියලා බැඳලා රතුමල් පළන්ඳවල වදබෙර ගසමින් වීථි සංචාරය කරවලා දකුණු වාහල් කඩෙන් පිටමන් කරල ගෙල ගසා දැමිය යුතුයි කියා රාජ දණ්ඩනය පැනෙව්වා. මේ තමා ලෝකයේ පළමුවරට ප්‍රාණඝාත පාපය ඇති වූ අවස්ථාව ඒ වන විට මනුෂ්‍යයන්ගේ පරමායුෂ අවුරුදු අසූ දහසයි. ඒ ප්‍රාණඝාත  පාපය සිදු කිරීමට මනුෂ්‍යයන් අතර අවි ආයුධ බහුල වුණා.

ආත්ම ආරක්ෂාව සඳහා අවි ආයුධ නිපදවූ අතර දාමරිකකම් කිරීමට දාමරිකයන් විසින් අවි ආයුධ පාවිච්චි කළා. අන්තිමේදී ප්‍රාණ ඝාත අකුසලය වැඩිවීමෙන් ඒ කාලයේ අසූදහට තිබුණු පරමායුෂ ඔවුන්ගේ දරුවන්ට මුණුබුරන්ට අඩුවී ගොස් අවුරුදු හතලිස් දාහට බැහැලා ගියා. දැන් පරම්පරා අවසානයි.

ඊළඟට ඒ කාලයේ දී නැවත කේලාම් කීම ලෝකයේ ඇතිවුණා. ඒ කේලම් කීමේ පාපය ලෝකයේ බහුල වීමෙන් ඔවුන්ගේ දරුවන්ට මුණුපුරන්හට වයස අවුරුදු දසදහසට බැහැල ගියා.

දස දහසකට පරමායුෂ බැහැලා තියෙන කාලයේදී කාම මිච්ඡාචාර පාපය ලෝකයේ බහුල වුණා. එම පාපය ලෝකයේ බහුලවීම නිසා ඔවුන්ගේ දරුවන්හට මුණුපුරන්හට වයස අවුරුදු පන්දහසකට අඩු වුණා.

පන්දහසකට පරමායුෂ තිබෙන කාලයේදී මනුෂ්‍යයන් අතර පරුෂ වචන සම්ප්‍රප්පලාප කියන අකුසල් දෙක බෝවුණා. මෙම භයානක අකුසල් දෙක නිසා ඔවුන්ගේ දරුවන්හට

මුණුපුරන්හට වයස අවුරුදු දෙදහස් පන්සියකට බැහැල ගියා.

දෙදහස් පන්සියකට පරමායුෂ තිබුණු කාලයේදී අභිජ්ඣා - ව්‍යාපාද කියන අකුසල් දෙක ලෝකයේ බහුල වුණා. ඒ පාපය බෝවීමෙන් ඔවුන්ගේ දරුවන්හට මුණුබුරන්හට වයස අඩුවෙලා දහසට බැස ගියා.

වයස අවුරුදු දහසට තිබෙන් කාලයේදී දසවස්තු මිත්‍යා දෘෂ්ඨිය ලෝකයේ ඇති වුණා. මේ භයානක මිත්‍යදෘෂ්ඨිය ලෝකයේ බහුලවීමෙන් ඔවුන්ගේ දරුවන්හට මුණුබුරන්හට වයස අඩුවෙලා පන්සීයට බැහැල ගියා

පන්සියයට පරමායුෂ තිබුණු කාලයේදි මවට නොසැලකීම, පියාට නොසැලකීම වැඩි හිටියන්ට නොදැලකීම, සිල්වත් ගුණවත් උතුමන් හට නොසැලකීම කියන මෙම අකුසල් පහ ලෝකයේ බෝවුණා. එම අකුසල් පහ නිසා පන්සියයට තිබුණු පරමායුෂ ඔවුන්ගේ දරුවන්හට මුණුබුරන්හට වයස දෙසීය පනහට බැහැල ගියා.

දෙසිය පනහට පරමායුෂ තිබුණු කාලයේදි අධර්මරාග, විෂම ලෝභ, මිත්‍යා ධර්ම, කියන මෙම නින්දිත වූ පාපක්‍රියා තුන ලෝකයේ ඇති වුණා. මෙම අකුසල් තුන ලෝකයේ බෝවීමෙන් ඔවුන්ගේ දරුවන්හට මුණුපුරන්හට පරමායුෂ අවුරුදු සියයට බැහැල ගියා.

මිනිස් ලොව පරමායුෂ අවුරුදු සියයට තිබුණු කාලේ තමයි අපේ බුදුරජාණන් වහන්සේ ලොව පහල වුණේ. අසූ දහසකට තිබුණු පරමායුෂ අපේ බුදුරජාණන් වහන්සේගේ කාලය දක්වාම ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා ක්‍රමානුකූලව පිරිහී ගිය ආකාරය එදා ධර්ම දේශනාවේදී බුදුරජාණන් වහන්සේ තෝරා දුන්නා. මෙම කාරණය ඉතාම සංවේගාත්මක සිද්ධියක්.

ඉන් පසුව උන්වහන්සේ දේශනා කළා මේ සියයට තිබෙන පරමායුෂ අනු ක්‍රමයෙන් අඩුවෙලා අඩුවෙලා ගොස් මිනිස් ලොව පරමායුෂ දස වර්ෂයට බහිනවා. ඒ සිදුවීම අනාගතයේදී සිදුවන දෙයක්. පරමායුෂ දස වර්ෂයට බැස්සාම මනුෂ්‍යයෝ මනුෂ්‍ය ගුණ ධර්ම වලින් සම්පූර්ණයෙන්ම අහසට පොළව වගේ ඈත් වෙනවා. තිරිසන් ගති සතුන් මෙන් ඒ හා සමාන තත්ත්වයට පත්වෙනවා. මේ මවුතුමිය, මේ පියතුමාය, මේ සහෝදරිය, මේ සහෝදරයා ආදි කිසිම බේදයක් නැතිව ලෝක සම්මිශ්‍රණය වෙනවා. පාප

ධර්මයන්ගේ යෙදෙනවා. අන්තිමේදි ඔවුන්ගේ කිසිම ගුණධර්මයක් නැති බැවින් ඔවුන්ගේ අකුසල උත්සන්නවීම හේතුවෙන් සත්ව විනාශයක් සිද්ධ වෙනවා. දින හතක් නොකඩවා වහින වැස්සකින් තෙමෙන තෙමෙන සියල්ලෝම ඔවුනොවුන් කපා කොටාගෙන වැනසෙනවා. කල් ඇතිව ඒ බව දැන ගත්ත ඉතාම ටික දෙනෙක් ගස් බෙනවලට, ගල්ගුහා වලට, බිංගෙවල් වලට, ගොස් එක් එක්කෙනා තනිව ඉඳලා ජීවිත ගලවා ගන්නවා. ඒ බේරෙන කීපදෙනා සංවේගවෙලා හිතනවා.....

මේසා විශාල සත්ව විපත්තියක් වුණේ ප්‍රාණඝාත අකුසලය නිසා නේද? ඒ නිසා අපි සතුන් මැරීමෙන් වැලකෙමු. කියලා ඔවුන් ප්‍රාණඝාතයෙන් වලකිනවා. ඒ ප්‍රාණඝාත අකුසලයෙන් වැලකීමේ කුසලය හේතුවෙන් ඔවුන්ගේ දරුවන් හට පරමායුෂ අවුරුදු විස්ස දක්වා වැඩිවෙනවා.

ඒ දරුවෝ අදින්නාදානා පාපය අත්හරිනාවා ඔවුන්ගේ දරුවන්ට ඒ හේතුවෙන් පරමායුෂ අවුරුදු හතලිහ දක්වා වැඩි වෙනවා.

ඔවුන්ගේ දරුවෝ කාමමිච්ඡාචාර පාපය අත්හරිනවා. ඔවුන්ගේ දරවන් හට වයස අවුරුදු අසූව දක්වා වැඩිවෙනවා.

මේ ආකාරයෙන් අනුපිළිවළින් අකුසල් අත්හරින්න, අත්හරින්න, කුසල් කරන්න, කුසල් කරන්න, දෙගුණ, තෙගුණ, සිව් ගුණ, දස ගුණ සියක් ගුණ ආදි වශයෙන් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා පරම්පරාවෙන් පරම්පරාවට වර්ධනයවී ගොස් මනුෂ්‍යන්ගේ පරමායුෂ අවුරුදු අසංඛ්‍යය දක්වාම වැඩිවෙනවා. ඒ කාලයේදී දිව්‍යලෝකවල දෙවියන්ට වඩා මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයන්ට සැප බහුල වෙනවා. දිව්‍ය ලෝකවලටවඩා මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයන්ට සැප බහුල වෙනවා. දිව්‍ය ලෝකවල කිසි කලෙකවත් ආයුෂ වැඩිවීමක් නැහැ. හැමදාම ඒක එක සංඛ්‍යාවයි දිව්‍ය ලෝකයන්හි පරමායුෂ.

චාතුර්මහා රාජික දිව්‍ය ලෝකයට - මනුෂ්‍ය වර්ෂ ප්‍රමාණයෙන් අවුරුදු අනු ලක්ෂයයි. වයස ඊට වැඩි වෙන්නේ නැහැ.

| | | |
|---|---|---|
| තව්තිසාවට | - | තුන්කෝටි හැට ලක්ෂයයි. |
| යාම දිව්‍යලෝකය | - | දාහතර කෝටි හතලිස් ලක්ෂයයි. |
| තුසිතයට | - | පනස්හත්කෝටි හැට ලක්ෂයයි. |
| නිර්මාණ රතියට | - | දෙසියතිස්කෝටි හතලිස් ලක්ෂයයි. |

පරනිර්මිත වසවර්ති දෙව්ලොවට - නවසිය විසිඑක්කෝටි හැට ලක්ෂයයි.

දිව්‍ය ලෝක හයේම පරමායුෂ එකතු කළත් එක්දහස් දෙසිය විසි අට කෝටි පනස් ලකෂයයි. මනුෂ්‍ය වර්ෂ ප්‍රමාණයෙන් දෙවියන්ගේ ආයුෂ. එසේ උනත් මනුෂ්‍ය ලෝකයේ පරමායුෂ අවුරුදු අසංඛෙය්‍ය දක්වාම වැඩිවෙන කාලයක් තියෙනවා. ඊළඟට භාග්‍යවතුන් වහන්සේ දේශනා කළා මේ මනු ලොව අසංඛයයයක් තිබෙන ආයුෂ පිරිහී නැවතත් මනුෂ්‍යන්ගේ අකුසල් උත්සන්නවීම නිසා ටිකෙන් ටික මනුෂ්‍යයන්ගේ ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා අඩුවීගෙන බැස යනවා.

මෙසේ අවුරුදු අසූ දහසකට පරමායුෂ බසින කාලයේදී මනුෂ්‍ය ලෝකයේ රාජධානි අසූ හාරදහසක් ඇති වෙනවා. ඒ අතුරින් අග්‍රගන්‍ය ප්‍රධාන රාජධානිය කේතුමතී නම් වෙනවා. කේතුමති නුවර යොදුන් 12ක් දිගින් යුක්තවන අතර යොදුන් 7ක් පළලින් යුක්ත වෙනවා. සත්රුවන් ප්‍රාකාර 7කින් වටවෙනවා. සත්රුවන් තාල පන්ති 7කින් අලංකාර වෙනවා. කල්ප වෘකෂ සිව් දිග පහල වෙනවා. දිව්‍ය විමාන වැනි සත්රුවන්මය මාළිගාවල් ඇති වෙනාව. සැබවින්ම අද කාලයේ දී මේවා සම්බන්ධව කියන කොට සුරංගනා කථා කියලා හිතෙන්න පුලුවන්. එසේ නමුත් මේවා සියල්ලම පුණ්‍ය මහිමයෙන්ම සිද්ධවන සත්‍ය නිර්මාණ. මේවා දෙවියන් විසින් මවාපානවා නෙවෙයි. ඒ කාලයේදී පහල වන පුණ්‍යවන්ත උතුමන්ගේ පිනේ මහිමයෙන් සිදුවන සම්පත්. පෙර ජාතියකදී පියකෙනෙක් සහ පුතනුකෙනෙක් විසින් හත්වාරයක්ම පසේ බුදුවරයන් වහන්සේ නමකට දිඹුල් (අට්ටික්කා) ලීයෙන් කුටි සකස් කරදී, බට පැළලි වලින් ආවරණය කරල බට කොල සෙවිලිකර කුඩා කුටියක් ඉදිකරවා, තුන් මාසය - තුන් මාසය බැගින් වාර 7ක් ම වස් වස්සලා, තුන් සිවුරු සහිතව සිව් පස පූජා කිරීමේ පිනේ මහිමයෙන් එම පියතුමත් පුතනුවොත් දෙදෙනා දිව්‍ය ලෝකයේ ඉපදී සිට, එයින් පුත්‍ර දිව්‍ය රාජයා අවුරුදු අසංඛෙය්‍ය ආයුෂ කාලයේ මනුලොව පහලවී ''මහාපනාද' නම් සක්විති රජවී, තවත් බොහෝ කුසල් රැස් කරගෙන දෙව් ලොව ගියා. ඒ මහාපනාද රජතුමාගේ කාලයේදි, අර පූර්ව ජාතියකදි දිඹුල් ලීයෙන් කුටි සේනාසන කරවා පූජා කළ අනුසස් බලයෙන් විසිපස් යොදුන් සත්රුවන්මය. දිව්‍ය ප්‍රසාදයකයි රාජ්‍ය කරනු ලැබුවේ.

එතුමා දෙව්ලොව ඉපිද නැවත අපේ බුදු රජාණන් වහන්සේගේ කාලයේදී මනුලොව දඹදිව භද්දිය නගරයේ සිටු පුත්‍රයෙක්ව ඉපිද බණ අසා, පැවිදිවී, සව් කෙලෙසුන් ජයගෙන මහරහත්භාවයට පත්වුණා. අසූමහ ශ්‍රාවකයන් අතරට පත්වී භද්‍රජි මහරහතන් වහන්සේ නමින් ප්‍රසිද්ධියට පත්වුණා. ඒ අතරත්

පිතෘ දිව්‍ය රාජයා තවමත් ඉන්නවා දෙව්ලොව නළකාර දිව්‍ය පුත්‍රයා නමින්. මෙතුමා අනාගතයේදි කේතුමති රාජධානියෙහි සංඛ නමින් සක්විති රජ වෙනවා. එම සංඛ නම් සක්විති රජතුමාට සෑම සම්පත්තියක්ම අසූ හතර දහස බැගින් ලැබෙනවා. ඒ කාලයේ දි මනුලොව පුදුමාකාර සශ්‍රීක කාලයක් වෙනවා. හරියට උණවණයක් වගේ. ජනගහනය ඇති වෙනවා. කවර තැනකවත් යුද්ධ, කළු කෝලාහල ඇතිවෙන්නෙ නැහැ.

අසමගිකම්, අසමාදානකම් ඇතිවෙන්නෙ නැහැ. ප්‍රාණඝාත සිදුවන්නෙ නැහැ මුසාවාදා සිදුවන්නෙ නැහැ. කාමමිච්ඡාචාරා නැහැ. පිසුනාවාචා නැහැ. පරුෂා වාචා නැහැ සම්ප්‍රප්පලාපා නැහැ. සුරාපාන නැහැ. මොනම පාපයක්වත් ඒ කාලයේදි මනුෂ්‍යයෝ අතර සිදුවන්නේ නැහැ. ඒ කාලයේදි මනුෂ්‍යන් පරම සුඛිත මුදිතයි. පරම ධාර්මිකව කාලය ගත කරනවා. ඒ කාලයේදි යුද්ධ හමුදාවක් අවශ්‍ය නැහැ. ඒ කාලයේදී පොලිස් හමුදාවක් අවශ්‍ය නැහැ. ඒ කාලයේදි බෝම්බ පිපිරීමක් නැහැ. අවි ආයුධ ගැටීමක් නැහැ. කිසිම ගිනි අයුධ නිෂ්පාදනයක් සිදුවන්නේ නැහැ. ඒ කාලයේදි වස විස පරිහරණයක් නැහැ. ඒ කාලයදි කෘෂි නාශක ආදියත් නැහැ. ඒ කාලයේදි ගොයම් ආදි ශෂ්‍ය ධාන්‍ය ආදියට කිසිම රෝගයක් නැහැ.

එක වී ඇටයක් රෝපණය කළාම ගැල් හැට දහසක් තරම් අස්වැන්න ලැබෙනවා. මෙසේ පුදුමාකාර සශ්‍රීක වාසනාවන්ත කාලයක්. ඒ කාලයේදි මනුෂ්‍යන්ට කිසිම රෝගයක් නැහැ.

කුසගිනි ඇතිවෙනවා බත් මතය ඇති වෙනවා පරමායුෂ ගෙවන කොට ජරා ලක්ෂණ පහළ වෙනවා. එපමණයි තිබෙන්නේ. ආහාර ගන්න බඩගින්න අතිවෙනවා. මේක එක රෝගයක්. එසේ නමුත් එය බෙහෙත් ගතයුතු රෝගයක් නොමෙයි. ආහාර ගත යුතු රෝගයක් ආහාර අනුභව කළාට පසුව බත්මතය අති වෙනවා. ඒක ස්වාභාවික සිදුවීමක්. වයස අවුරුදු අසූ දහස පිරුණාම ඒ මනුෂ්‍යයන්ගේ හිසකේස් සුදුවීම, දත් දුර්වර්ණ වීම, ඇඟ රැලි වැටීම, ආදි ලක්ෂණ පහල වෙනවා. මේ හැර වෙන කිසිම රෝගා බාධයක් නැහැ.

ඒ කාලයේදි සංඛ නැමැති සක්විති රජ කෙනෙක් පහළ වෙනවා. එතුමාගේ අග්‍ර පුරෝහිත ''සුබ්‍රහ්ම'' කියන බ්‍රහ්මණ පියතුමාටත් ''බ්‍රහ්මවතී'' කියන මව්තුමියටත් පුත්‍රව

සොළසාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පාරමී පුරාගෙන පැමිණෙන ''අජිතමෙත්තෙය්‍ය'' මහාබෝධි සත්වයන් වහන්සේ මීට සොළසාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයකට පෙර ''ප්‍රභාවන්ත'' නමින් සක්විති රජවී සිටි කාලයේදි මුහුර්ති නමින් ලොව්තුරා සම්මා සම්බුදු කෙනෙක් පහළවී සිටියා. මෙහි මුහුර්තී බුදුරජාණන් වහන්සේගේ කාලේදී ප්‍රභාවන්ත සක්විති රජතුමා තමන්ගේ සියලු සම්පත් දන්දීලා විශාල පිරිසක්ද සමග එම බුදු සසුනේ පැවැදි වී ''රත්න ස්ථවිරයන් වහන්සේ'' නමින් ප්‍රසිද්ධ වුණා. එම රත්න ස්ථවිරයන් වහන්සේගේ සිත නැමුනේ. ලොව්තුරු සම්මා සම්බුදු බව පිණිසයි. එබැවින් එම ජීවිතයේදි මඟීඵල නිවන් ලබන්නට කිසිදු අපේක්ෂාවක් නැතිව බුදුබව ප්‍රාර්ථනා කරමින් පාරමී පුරන්නට සිත නැමුණා. තමන් වහන්සේ පිඬු සිඟා ලබාගෙන දාන පාත්‍රයෙන් සෙසු මහා සංඝයාට දන් දෙනවා. උදේ වරුව පුරාම එම දාන පාරමිතාව පිරුවා.

කිසි දිනක ඒ සඳහා අලස බවක්වත් පසුබට බවක්වත් නැහැ. පුදුමාකාර ශ්‍රද්ධාවෙන් මේ දානය පරිත්‍යාග කළා. පිණ්ඩපාතය සඳහා වැඩල දානය ගෙනවිත් සංඝයාට බෙදනවා. නැවතත් ගමට වැඩල පිඬුසිඟාගෙන ගෙනවිත් බෙදනාවා. මේ ආකාරයට දාන පාරමිතාව පුරාගෙන කලක් ගත වෙන කොට ඇතැම් භික්‍ෂූන් වහන්සේලා අතර කථාවක් ඇති වුණා. මෙම ස්වාමින් වහන්සේ පිළිබඳව සක්විති සැපත් අතහැර දමා පැවිදි වූ මේ රත්න ස්ථවිරයන් වහන්සේ මහ පුදුම භික්‍ෂූන් වහන්සේ කෙනෙක්නෙ. තමාට යැපෙන පමණට පිඬුසිඟා වළඳන්නේ නැතිව තමන් වහන්සේ පිඬුසිඟා ගෙනවිත් අනිකුත් භික්‍ෂූන් වහන්සේලාට වළඳානවා නේදා? අනේ මුන්වහන්සේ අනාගතයේදි සක්විති රජ වෙයිද? බඹලොව යනවද? එසේ නැතිනම් රහත් බෝධියද පතන්නේ. ලොව්තුරා සම්මා සම්බෝධියද පතන්නේ. අදි වශයෙන් මහ සංඝයා අතර දම්සභා මණ්ඩපයේදි සාකච්ඡාවට භාජනය වුණා. ඒ අතර එම මුහුර්ති බුදුරජාණන් වහන්සේ එතැනට වැඩම කරල ඒ භික්‍ෂු සංඝයා වහන්සේ අමතා වදාළා.

මහණෙනි, මෙම රත්න ස්ථවිරයන් වහන්සේ එසේ මෙසේ ස්වල්ප ප්‍රාර්ථනාවක් ඇති කෙනෙක් නොවෙයි. මෙතුමා අති දීර්ඝ කාලයක් බුදුබව පතාගෙන පැමිණි බුද්ධාංකූරයන් වහන්සේ කෙනෙක්. මෙතුමා අද මෙම ජීවිතයේදි මාගේ ශාසනයෙහි පැවිදිවී දානපාරමී ශිර්ෂයෙන් කරන පිංකම් පෙළ අනාගතයේදි මෙතැන් සිට සොළසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට පසුව ''මෛත්‍රී'' නමින් ලොව පහලවී ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍යට පත්වීමට

හේතුවන පාරමිතා පිංකමක් පිඬුසිඟා දන්දීමෙන් සිදුකරනු ලබන්නේ. මෙතුමා නම් මතු අනාගතයේදි මෛත්‍රී නමින් ලොව්තුරා සම්මා සම්බුදු වෙනවා. ඒ ජීවිතයේදි උන්වහන්සේගේ මව්පිය දෙපළ සුබ්‍රහ්ම සහ බ්‍රහ්මවතී නම් වෙනවා. උන්වහන්සේගේ පරමායුෂ අවුරුදු අසූදහසක් වෙනවා. උන්වහන්සේ අවුරුදු අටදහසක් ගිහි ජීවිතය ගත කරලා මාළිගාවද සමග අහසින්ම වැඩම කරල දින හතක් දුෂ්කර ක්‍රියා කරල. නාග බෝධි මූලයේදි මෛත්‍රී නමින් ලොව්තුරා සම්මා සම්බුදු රාජ්‍යයට පත්වී වදාරණවා..... යනාදි වශයෙන් එම අනාගතාංශ වාක්‍යය එදා ඒ මුහුර්ති නැමති ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් මහ සඟරුවන ඉදිරියේ දේශනා කොට වදාළහ.

මේ තමා මෛත්‍රී බෝධිසත්වයන් වහන්සේට මතු ලොව්තුරා සම්මා සම්බුදුවන බවට ප්‍රථම වරට නියත විවරණ ලැබුණු අවස්ථාව. එම මුහුර්ති බුද්ධ ශාසන කාලයේ මනුලොව පරමායුෂ අවුරුදු ලක්ෂයයි. ඒ අවුරුදු ලක්ෂයක් මුළුල්ලේ දාන, ශීල, නෙක්ඛම්ම ආදි පාරමීපිරූ රත්න ස්ථවිරයන් වහන්සේ හෙවත් මෛත්‍රී බෝධි සත්වයන් වහන්සේ අපේ සිද්ධාර්ථ මහා බෝධිසත්වයන් වහන්සේටත් වැඩි කාලයක් මුළුල්ලේ එසේ පාරමී සම්පාදනය කරගෙන පැමිණිලයි දැනට තුසිත දිව්‍ය ලෝකයේ අජිත මෙත්තෙය්‍ය නමින් දිව්‍ය රාජයෙක්ව ඉපිද සිටින්නේ.

අනාගතයෙහි එම කේතුමතී රාජධානියෙහි සංඛ නම් සක්විති රජතුමාගේ කාලයේදී සුබ්‍රහ්ම - බ්‍රහ්මවතී නැමැති දෙමාපියන්ට දාව උත්පත්තිය ලබනවා. ඒ කාලයේදි මහාපනාද රජතුමා සැපවින්ද විසිපස් යොදුන් උස ඇති සත්රුවන්මය ප්‍රසාදයක් පහළවී ගිහි ජීවිතය අවුරුදු අටදහසක් ගත කරලා පුත්රුවන උපන්න දවසේදීම, සතර පූර්ව නිමිති දැකල අභිනිෂ්ක්‍රමණය කරනව, මාළිගාවේදීම අර්හත් බ්‍රහ්මයෙකු විසින් පිළිගන්වනු ලබන අටපිරිකර හැඳ පොරවාගෙන උතුම් පැවිද්දට පත්වී දින හතක් නාග බෝධියට පිටදීගෙන දුෂ්කර ක්‍රියාව සිදුකරල දස දහසක් ලෝක ධාතූන් කම්පා කරවමින් මෛත්‍රී නමින් ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍යයට පැමිණෙනවා.

උන්වහන්සේට කිරිපිඬු පිළිගන්වනු ලබන්නේද, උන්වහන්සේගේ ගිහි ජීවිතයේදි අග බිසව බවට පත්ව සිටි චන්ද්‍රමුඛී නැමැති අග්‍ර මහේසිකාවගේම සියතින්. ඉන්පසු සංඛ නම් සක්විති රජතුමාද අසූ හතර දහසක් පරිවාර රජවරුන් සමගම මෛත්‍රී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සමීපයේදී ඒහි භික්ෂුභාවයෙන් පැවිදිව රහත් වෙනවා.

එසේම බ්‍රාහ්මණවරු අසූ හතර දහසක් - ගෘහ පතිවරු

අසූ හතර දහසක් යනාදි ක්‍රමයෙන් මහත් ආශ්චර්‍ය්‍ය අන්දමින් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, ආදි හැම වංශයකින්ම පැමිණ මෛත්‍රී බුදු සසුනෙහි පැවිදිවී නිවන් සුව ක්ෂාත්සාත් කර ගන්නව.

ඒ ආකාරයේ කෝටි සංඛ්‍යාත ශ්‍රාවක පිරිසක් ඇතිව එම මෛත්‍රී ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ අසූ දහසක් පරමායුෂ වින්දනය කරල. සූවිසි අසංඛෙය්‍ය හැටකෝටි පනස් ලක්‍ෂයක් පමණ ජනතාව ජීවමාන කාලයේදීම බියකරු සංසාර සාගරයෙන් එතෙර කරවා අමාමහ නිවන් පුර පමුණුවනු ලබනවා. එදා සම්බුදුරජාණන් වහන්සේ විසින් මගධ ක්‍ෂෙත්‍රයේ මාතුල ජනපදවාසී ජනතාව ප්‍රධාන මහා සඟපිරිසට මෙම ඉතාම වටිනා දහම් විස්තරය පහදා දුන්නා.

කුසලානං භික්ඛවේ ධම්මානං සමාදාන හේතු පුඤ්ඤං පවඩ්ඪති, නළකාර දිව්‍ය පුත්‍රයා පෙර ජාතියකදි මනුලොව ඉපිද බටලීයෙන් කර්මාන්ත කරන දුගී දුප්පත් මනුෂ්‍යයෙකුව සිට පසේ බුදුරජාණන් වහන්සේ නමකට දිඹුල් ලීයෙන් කුටියක් කරවා තුන් මාසය - තුන් මාසය බැගින්  හත් වාරයක්ම තුන් සිවුරු සහිතව සිවු පසයෙන්  උපස්ථාන කළ පිනේ ආනිශංශ බලයෙන්, එම පියතුමාත්, පුතණුවොත්, යන දෙදෙනා මේසා විශාල මනුෂ්‍ය සම්පත්, දිව්‍ය සම්පත් වින්දනය කර, එතෙකින් නොනැවතී බුදු සසුන් දෙකකදි මගඵල නිවන් ලබන්නට එම කුසලය පාරමී කුසලයක් බවට පත්වුණා.

එම පුත්‍රරත්නය අපේ මේ ගෞතම බුදු සසුනෙහි පැවිදිව රහත් වී හද්‍රජී ස්ථවිරයන් නමින් ප්‍රසිද්ධ වූ අතර එම පියාණන් වහන්සේ දැනට දෙව්ලොව නළකාර දිව්‍ය පුත්‍රයා නමින් දෙව් සැප විඳ මෛත්‍රී බුද්ධ ශාසන කාලයේදි සංඛ නමින් චක්‍රවර්තී රජවී එම රාජ්‍ය සම්පත් ද, හැර දමා, එම මෛත්‍රී බුදු සසුනෙහි පැවිදිවී සිවුපිළිසිඹියා ඥාණ ලාභිව රහත් බෝධියෙන් නිවන් සුව ලබන්නට වාසනාවන්ත වෙනවා. එබැවින් කුසල ධර්මයන් සිදු කිරීමේදි එම පිංකම ලොකු කුඩා සෑම පිංකමක්ම නිවන් සුව පතා සිදුකළ යුතුයි කියන කරුණ මෙම උපදේශයෙන් පහදා දී වදාළා.

*ඉන් අනතුරුව භාග්‍යවතුන් වහන්සේ වදාළා.  ප්‍රථමයෙන් අතීත පුවතකුත් අනාගත වංශයකුත් දේශනාකර ඉන්පසුව විස්තර පහදා දුන්නා. මාගේ ශාසනයෙහි භික්‍ෂු,භික්‍ෂුණී, උපාසක,උපාසිකා, යන සිව්වනක් පිරිසෙහි සෑම දෙනාම ආයුෂයෙන් වර්ණයෙන් සැපයෙන් බලයෙන් ප්‍රඥාවෙන් දියුණු

වනු පිණිස මෙම මනුෂ්‍ය ලෝකයේත් දිව්‍ය ලෝකයන්ගෙත් පරමායුෂ වින්දනය කරන්නට වෙනස් නොවන සදාකාලික නිවන් සුව විඳින්නටත් හේතුවන සෘධිපාද හතර ගැනයි. විස්තර කළේ. දාන-සීල-භාවනා ආදී කුසල් පාරමී පිරීමේ ඡන්ද සෘධි පාදය, - වීර්‍ය සෘධි පාදය - චිත්ත සෘධි පාදය - වීමංසා සෘධි පාදය යන මෙම සෘධි පාද හතර යම්කෙනෙක් වැඩුවානම් එම පුද්ගලයා උපනූපන් භවයක් පාසාම අල්ප ආයු ජීවිත නොලබා, පරමායුෂ වින්දනය කරන්නෙක් බවට පත් වෙනවා. එපමණක් ද නොව වෙනස් නොවන අයුෂවන සදාකාලික ශාන්ති අමාමහ නිවනට පත්වීමද හේතු වන බැවින් මාගේ ශ්‍රාවකයෝ අයුෂයෙන් වැඩෙනු පිණිස ඡන්ද - චිත්ත - වීර්ය -වීමංසා ධර්මයන් වඩත්වා. යනුවෙන් අනුශාසනා කළා.

*වර්ණ සම්පත් නමින් දේශනා කළේ රූප ශරීර වර්ණය හෝ ගුණ වර්ණනාව නොවෙයි. එම රූප වර්ණය සහ ගුණ වර්ණය යන දෙකම ලැබෙන්නට හේතුවන ශිල සම්පදාවයි. සීල සම්පදාව යමෙකු විසින් මැනවින් ආරක්‍ෂා කරනවා නම් ඒ බෞද්ධයා සසර ගමනේදි උපනූපන් භවයක් පාසාම ශරීරයෙන්ද වර්ණවත් වෙනවා. ලස්සන වෙනවා. ගුණ සම්පත්තියෙන්ද වර්ණනා කළයුතු කෙනෙක් බවට පත්වෙනවා. එබැවින් මාගේ ශ්‍රාවකයෝ වර්ණ සම්පන්නවනු පිණිස වඩ වඩාත් සීලවන්තයන් බවට පත්වෙත්වා කියා තථාගතයන් වහන්සේ අනුශාසනා කළා.

*එසේම සැපය නමින් පහදා වදාළේ මෙම ලෝකයේ තිබෙන උපභෝග - පරිභෝග සැප සම්පත් විඳිමින් ඉන්ද්‍රියන් පිනවීමේ සැපය නොවෙයි. එතුලින් ලෝභාදි කෙලෙස් වර්ධනය වන්නේ මෙතනදි සැපය නමින් විස්තර කළේ විතක්ක - විචාර - පීති - සුඛ ඒකාග්‍රතා ආදී ප්‍රථමධ්‍යානාදි වූ දේ මෙම ධ්‍යාන සම්පත්තිය උපදවා ගත්තා නම් එම ධ්‍යාන සම්පත්තිය නිරාමිස සැපය නමින් හැඳින්වෙන්නෙ. එබැවින් මාගේ ශ්‍රාවකයෝ නිරාමිස වූ සැපයෙන් සැපවත් වනු පිණිස වඩ වඩාත් චිත්ත සමාධි භාවනා වඩත්වා කියා අනුශාසනා කළා.

භෝග නමින් ඊලඟට අදහස් වන්නේ ගෙවල් දොරවල්, මිළ මුදල්, ඉඩ කඩම්, වාහන ආදී සම්පත් නොවෙයි. ඒ වාගේ භෝග සම්පත් උපනුපන් භවයන්හීදී ඉබේම ලැබෙන්න හේතුවන කරුණු හතරක් තියෙනවා. ඒවා නම් 01. මෙත්තා 02. කරුණා 03. මුදිතා 04. උපේක්ඛා යන හතරයි. එම මෛත්‍රි, කරුණා, මුදිතා, උපේක්ඛාවන් යම් පමණට වඩවනවා. නම් ඒ ඒ ප්‍රමාණයට පුද්ගලයන් උපනුපන් භවයක් පාසාම අපරිමිත සම්පත් පිරී ඉතිරී

ලැබෙනවා. දෙවියන්ටත්, මනුෂ්‍යන්ටත්, දෙමව්පියන්ටත්, සහෝදර, සහෝදරියන්ටත්, දූ දරුවන්ටත්, අසල්වාසීන්ටත්, සේවක, සේවිකාදීන්ටත්, සෑම දෙනාටම මුදුන් මල් කඩක් වාගේ, ගෙලේ පැළඳි, ස්වර්ණ මාලාවක් වගේ, ගෞරවාන්විත පුද්ගලයෙක් බවට පැමිණෙනවා. එසේම සකල සම්පත් පිරී ඉතිරී ලැබෙන්නට හේතුවන්නේ මෙම සතර බ්‍රහ්ම විහරණයන් වැඩීම නිසයි. එබැවින් මාගේ ශ්‍රාවකයෝ භෝග සම්පන්න වනු පිණිස සිවුබඹ විහරණ වඩත්වා යනුවෙන් අනුශාසනා කළා. ධනය නමින් මෙහිදී දේශනා කොට වදාළේ ධන බලය හෝ පිරිස් බලය හෝ රාජ්‍ය බලය හෝ මන්ත්‍ර ශාස්ත්‍රය බලය හෝ මිල මුදල් බලය වැනි බලයක් නොවෙයි. මේ නිසා ලෝකයෙහි අභිභවනය කරන්න අපහසු දුෂ්කරවු බලයක් තිබෙනවා. ඒ බලය නම් මාර බලයයි. මාර බලයන් පහක් තිබෙනවා.

01. ක්ලේෂ මාර 02. ස්කන්ධ මාර 03. අභිසංස්කාර මාර
04. දිව්‍ය පුත්‍ර මාර 05. මාච්චු මාර

මෙම පංච මාර බලයන් බිඳලන්න, අභිභවායන්න සමර්ථවූ බලයක් තියෙනවා. ඒකට කියන්නේ ප්‍රඥා බලය කියලා සුතමයේ ඥාණය, චින්තාමයේ ඥාණය, භාවනාමය ඥාණය ආදි වශයෙන් අර්හත් මාර්ග ඥානය දක්වා ඇති ප්‍රඥා සම්භාරය මෙතනදි බලය නමින් හැඳින් වෙනවා. එබැවින් මාගේ ශ්‍රාවකයෝ බලයෙන් වැඩෙනු පිණිස වඩ වඩාත් භාවනා වඩත්වා කියා අනුශාසනා කළා. තමාට තමා පිහිටක් කරගනු පිණිස ධර්මය තමාට පිහිටක් කරගනු පිණිස සීලයක පිහිටා සිටගෙන සෑම විටම කායානුපස්සනා, වේදනානු පස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සානා, කියන මෙම සතර ආකාර අනුපස්සනාවන් අතරින් එක්තරා අනුපස්සනාවක් වැඩෙන ආකාරයට ජීවිතය පවත්වාගත යුතුයි. එසේ පවත්වා ගැනීමෙන් ලෝකයෙහි, දෙමාපියන්ටත් ලබා දිය නොහැකි ශ්‍රමණ, බ්‍රහ්මණ, ආදීන්ටත් ලබා දිය නොහැකි. දෙවියන් බ්‍රහ්මයන්ටත් ලබාදිය නොහැකි, අති උත්තරීතර සතර මගඵල පිළිවෙලින් ලැබෙන ලෝකෝත්තර අමාමහ නිවනින් සැනසුම අත්පත් කර ගන්නට හැකිවෙන බව අවසාන වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළා. එම දේශනාවට සවන් දීගෙන සිටි පිරිස අතරින් භික්ෂූන් වහන්සේලාම විසිදහසක් දෙනා වහන්සේ මහා රහත්භාවයට පත්වී වදාළා. එසේම ගෘහස්ථ බෞද්ධයන් අතරින් ලක්ෂ කෝටි සංඛ්‍යාවක් එදා මගඵල නිවන් සුව ලැබුවා. එදා අහස පුරා සිටි දෙවියන් බ්‍රහ්මයන් අතරින්ද විශාල පිරිසක්, මගඵල නිවන් සුව අවබෝධ කළා.

මෙම චක්‍රවර්ති සිංහනාද සූත්‍රයෙහි සඳහන්වන කරුණු ඉතාම වැදගත් කරුණු පෙළක් වෙනවා. එබැවින් අපිත් මෙම ජීවිතයේදී දන් දෙමින්, සිල් රකිමින්, භාවනා වඩමින්, අධිෂ්ඨාන කරගත යුතු කරුණු රාශියක් මෙම ධර්ම දේශනයෙහි සඳහන් වුණා.

ලෝකයේ පිරිහීමට හේතුවුණේ දෙවියන්ගේ බලපෑමක් හෝ ඉබේ සිදුවූ දෙයක් නොවෙයි. ලෝකවාසී සත්වයන්ගේ සන්තානවල අකුසල් උත්සන්න වීම නිසයි සියලු පිරිහීම සිදුවන්නේ.

ලෝකයේ ජීවත්වන මනුෂ්‍යයන්ගේ ආයුෂ, වර්ණ, බල ප්‍රඥා, වැඩෙන්න හේතුවන්නේ ලෝක වාසී සත්වයන්ගේ කුසල් උත්සන්නවීම නිසයි. එබැවින් ලෝකයේ පිරිහීමත්, දියුනුවීමත් යන දෙකම සිදුවන්නේ බාහිර බලපෑමක් හේතුවෙන් නොවෙයි. ඒ ඒ සත්වයන්ගේ චිත්ත සන්තානවල පවත්නාවූ කුසලා කුසල කර්මයන්ගේ බලපෑම නිසා කියා මෙම සූත්‍ර දේශනාව අනුව තේරුම් ගන්නට හැකිවෙනවා.

එබැවින් අප හැම විටම දාන, ශීලාදි කුසල් සිදුකරමින් අධිෂ්ඨාන කළ යුතු වෙනාවා. ලෝකයේ පිරිහීමට හේතුවන කරුණු දහය එනම් ප්‍රාණඝාතය, සොරකම් කිරීම, පරදාර - පරපුරුෂ සේවනය, මුසාවාදය, කේලාම්කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අන් සතු දේට ලෝභ කිරීම, අනුන්ට ඊර්ෂ්‍යා ක්‍රෝධ කිරීම, මිසදුටු ගැනුම ආදි වූ මෙම පාප ධර්මයන් කවදාකවත් අපේ සන්තානවල පහල නොවේවා. කියන මේ උතුම් අධිෂ්ඨානය අපි නිතර පුරුදු කරගන්නට ඕනෑ. එම පස්පවු දස අකුසලයන්ගෙන් සදහටම වැලකී දස කුසල ධර්මයන්ට අනුවම ජීවත්වීමේ ශක්තිය අපට මෙම කුසලානුභාවයෙන් ලැබේවා. කියා අපි නිතර අධිෂ්ඨාන කිරීම වටිනවා. මෙම කාරණය මෙම සූත්‍රයෙන් ඉගෙන ගත යුතු ඉතාම වැදගත් පාඩමක් වෙනාව.

එසේම අනාගතයේදී බුදුවෙන මෛත්‍රි බුදුරජාණන් වහන්සේගේ බුදුසිරි දැක ගන්නට බෞද්ධයන් වශයෙන් අපි බොහොම කැමැත්තෙන් ඉන්නවා. අපේ පැරණි බෞද්ධයෝ නිතර, නිතර, අශිර්වාද කරන්න පුරුදුවී තිබුණා. මෛත්‍රි බුදුන් දැක නිවන් දකින්න වාසනාවේවා! කියලා. අපේ ධර්මයේ අට්ඨකථාවල, ටීකාවල බොහෝ සෙයින්ම සඳහන් වෙනවා. රහත්වෙන තරම් පිං ඇති උතුමන් මෛත්‍රි බුදුරජාණන් වහන්සේ දැක ගන්න ප්‍රාර්ථනා කරමින් නිවන් අවබෝධ කර ගැනීම පවා

මෛත්‍රී සාසනයතෙක් කල් දැමූ කථා තිබෙනවා.

සැබවින්ම මේ ගෞතම බුදු සසුනේදී මගඵල ලබන්න නොහැකි වෙනවා නොවෙයි. මේ බුදු සසුනේ මගඵල නිවන් ලබන්න තරම් හේතු සම්පත් තිබෙනවා. නම් එයට සුදුසු පිළිවෙත් පුරනවා නම් ඒකාන්තයෙන්ම මේ බුද්ධ ශාසනයේම නිවන් අවබෝධ කර ගන්නට හැකියාව තිබෙනවා.

යම් හෙයකින් මේ බුදු සසුනෙහිදී වැරදුනොත් රහත් බෝධිය පතන කෙනෙක් නම් මතු බුදුවන මෛත්‍රී බුදුසසුනේදී හෝ මට නිවන් සුව ලැබේවා! යනුවෙන් ප්‍රාර්ථනා කිරීමේ කිසිදු වරදක් නැහැ. එය නිවැරදි ප්‍රාර්ථනාවක් වෙනවා. එබැවින් එම මෛත්‍රී සම්බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අත්භූත බුද්ධ විලාශය දැක ගන්නටත්, මධුර මනෝහර ශ්‍රී සද්ධර්මය අසන්නටත්, මෙම ගෞතම බුදු සසුනේදී, කරන දානාදී කුසල් පාරමී ධර්මයන් අප සැම දෙනටෙම ඒකාන්තයෙන්ම හේතුවෙනවා, වාසනාවන්ත වෙනවා, එසේ වේවා. කියා අපි ප්‍රාර්ථනා කරමි.

එදා ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ අති උතුම් දහම් වැස්සෙන්, චිත්ත සන්තාන සිසිල් කර ගත්තාවූ, දහස් ගණන්, ලක්‍ෂ ගණන්, කෝටි ගණන්, අසංඛ්‍යෙය ගණන් ජනතාව අමාමහ නිවනට පැමිණියා. ඒ තථාගතයන් වහන්සේද දිනපතාම ලෝකය දෙස බුදු ඇසින් බලමින් ලොවට වැඩ සැලසුව. එසේම බුදුරැස් විහිදෙන දළදා ස්පර්ශ කරමින් මානෙල් මල් සුවඳ විහිදෙන ශ්‍රී මුඛ පත්මයෙන් අෂ්ඨාංග සමන්වාගත බ්‍රහ්ම ස්වරයෙන් සුවාසූ දහසක් ධර්මස්ඛන්ධය දේශනා කොට වදාළා. උන්වහන්සේ පිරිවන් ඇඳේ වැඩ ඉඳගෙන

**අන්තිම වරටත් ආනන්ද ස්වාමින් වහන්සේ අමතා වදාළා.**
**යෝ කෝ අනන්ද මයා ධම්මෝච විනයෝච**
**දෙසිතෝ පඤ්ඤත්තෝ සො මමච්චයේන සත්ථා.**

ආනන්දය, මා විසින් තොපට යම් ධර්මයක් දේශනා කරන ලද්දේ නම්, යම් විනයක් පණවන ලද නම්, මාගේ ඇවෑමෙන් ඒ ධර්මය, විනය ඔබට ශාස්තෘ කෘත්‍යය කරනවා. (ශාස්තෘන් වහන්සේ වෙනවා.) තමන් වහන්සේ පිරිනිවන් පානු ලබන්නේ එක් සර්‍වඥයන් වහන්සේ නමක් පමණයි. එසේ නමුත් සර්වඥයන් වහන්සේලා අසූහතර දහසක් ජීවමානයි කියා. මුළු බුද්ධ ධර්මයම ශාස්තෘන් වහන්සේ හැටියට ප්‍රතිඥා කොට වදාළා. අද

මේ පවතින්නේ එම උතුම් බුද්ධ ශාසනයයි. මෙම සර්වඥ ශාසනයෙහි යම් කෙනෙක් සීල, සමාධි, ගුණ පුරමින් අප්‍රමාදව වියඨී කරනවා නම් හේතු සම්පත් තිබුනේ නම් පුරන ලද පාරමී ඇතොත් මේ ජීවිතයේදිම මාර්ගඵල නිවන් සුව ලබන්නට හැකි වෙනවා.

යම් හෙයකින් මේ ජීවිතයේදී වැරදුනහොත් මෙම ගනු ලබන උත්සාහය නිෂ්ඵල නොවී, අපට මතු ජීවිතයකදි නිවන් සුව ලබන්නට පාරමී කුසල් බවට පැමිණෙනවා නියතයි. එබැවින් දුර්ලභව ලබාගත් මෙම අති උත්තරීතර ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයෙහි අප්‍රමාදව පිංකම් කර ගැනීම නැණවත් බෞද්ධයාගේ පරම යුතුකම් වෙනවා. එයට හේතුව නම් මේ වාගේ බුද්ධෝත්පාද කාලයක් ලැබෙන්නේ කල්ප කෝටි ගණන්වලදි අනේ අපට බුදු සසුනක් ලැබේවා. කියමින් අපමණ කාලයක් අපි ප්‍රාර්ථනා කරගෙන අවිල්ලයි අද අපට මෙම ගෞතම සම්බුදු සසුන ලැබිල තියෙන්නේ.

බුද්ධෝත්පාද කාලයක මිනිසත් බව ලැබීම ඊටත් වඩා දුර්ලභ දෙයක්. ඒ දුර්ලභ මිනිසත් බව ලැබෙන්නටත් කල්ප කෝටි ගණන් අපි ප්‍රාර්ථනා කරගෙන අවිත් තිබෙනවා. බුද්ධෝත්පාද කාලයක උතුම් මිනිසත් බවක් ලබාගෙන අන්ධ, ගොළු, බිහිරි, නොවී වාසනාවන්ත ජීවිත ඇතිව සැබෑ සම්මා දිට්ඨියෙහි පිහිටා දානාදි පාරමී පුරා ගන්න අපට වාසනාව ලැබේවා.යි කියමින් පතාගෙන පැමිණිලයි අපට මේ උතුම් අවස්ථාව ලැබිලා තියෙන්නේ. බුද්ධෝත්පාද කාලයක්, උතුම් මිනිසත් බවක්, ක්‍ෂණ සම්පත්තියත් කියන මේ සියල්ලම එකම තැනකදි ලැබී ඇති බැවින් හරියට අහසේ දිස්වෙන විදුලි එළියක් වගේ ඉතාම කෙටිකාලයක් පවත්නා මේ ජීවිතය තුළින් අපි වඩ වඩාත් නිර්වාණගාමී පාරමී කුසල් නෙලාගත යුතු වෙනවා. චින්තා මාණික්‍ය රත්නයක් අතට ලැබුණු කෙනෙක් එකේ අගය නොදන්නාකම නිසා එය ඉවත දැම්මොත් එකෙන් වැඩක් වෙන්නේ නැහැ. එසේ නැතිව එම චින්තා මාණික්‍යරත්නය උස්තැනෙක තියලා, සුවඳින්, මලින් පූජා කරමින් උපස්ථාන කිරීමේදි සිතූ පැතූ සම්පත් ලබාගත හැකි වෙනවා. ඒ වාගේ බුද්ධෝත්පාද කාලයක්, උතුම් මිනිසත් බවක් කියන අති උතුම් මේ චින්තා මාණික්‍යරත්නයන් ලැබුණාවූ නැණවත් බෞද්ධයා විසින් අප්‍රමාදව දාන, සීල, භාවනා, පිංකම් කරගෙන, තමාගේ ජීවිතයෙන් නියම ඵල නෙලාගන්නට උනන්දු විය යුතු වෙනවා. ඈත අතීතයේ සිටිය අපේ මුතුන් මිත්තන් අප්‍රමාදව ජීවත්වීම දෙවන තැන තියල, සසුන් ගුණ පිළිවෙත් පිරීම පළමු තැන තියල. පිහිටා කටයුතු කළ නිසයි, අද දක්වා බුදු සසුන ආරක්‍ෂාවී

තිබෙන්නේ. අනාගතයෙත් මෙම බුදු සසුන ආරක්‍ෂා උනොත් තවත් අවුරුදු දෙදහස් පන්සියයක් යනතුරු මගඵල නිවන් ලබන්නන් පහල වෙන්න පුළුවන්. එබැවින් තම තමාට හැකි පමනින් සම්බුද්ධ ශාසනය ආරක්‍ෂා කර ගනිමින්, තමන්ද බුදු සසුනෙන් අරක්‍ෂාවෙමින් ගුණ ධර්මයන් දියුණු කරගන්නට අධිෂ්ඨාන බල පිහිටුවා ගනිමු. එදා ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙසේ තුන්ලොවට පිහිටවී වැඩ සිට, අවුරුදු අසූවක් ආයු වළඳා ආයුෂ කෙළවර අනුපාදිශේෂ පරිනිර්වාණයෙන් නිවන් පුරවැඩියා. රහතන් වහන්සේලාද පිරිනිවුනා සෝවාන් ආදි ආයර්‍යයන් වහන්සේලා අපවත් වුණා.

සෙසු රාජ රාජ මහා මාත්‍යාදීන් සහිත කෝටි ගණන් ජනතාව ස්වකීය කර්මානුරූපව පරලොව ගියා. විහාරස්ථාන, රාජධානි, පොකුණු, උයන්, සියල්ල නෂ්ඨාවශේෂ වුණා. ඉර, හඳ, තාරකා, මහා පෘථිවිය, මහාමේරු පර්වතය, මහා සාගරය ආදි විශාල වස්තූන්ද ගෙවල් දොරවල්, ඉඩ කඩම්, යාන වාහන, ඇඳුම් පැළඳුම්, මිල මුදල්, ආදි සැප සම්පත් සියල්ලත්, සිත, ඇති, සිත නැති සියළු සංස්කාර ධර්මයන් ඇතිව නැතිවන බැවින් අනිත්‍යයි ඇතිවීම, නැතිවීම යන දෙකින් නිරතුරු පෙළෙන බැවින් දුකයි.

තම තමා කැමති කැමතිසේ නොපැවති යන බැවින් අනාත්මයි! මෙම ත්‍රිලක්‍ෂණයට යටත් සියලු සංස්කාරයන් දුක්ඛ ආර්ය සත්‍යයයි දුකට හේතුවන තෘෂ්ණාව දුක්ඛ සමුදය! ආයර්‍ය සත්‍යයයි! දුකත් සමුදයත් නැති ශාන්ත නිර්වාණ ධාතුව දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි. එම නිවන අවබෝධ කරගැනීමට වැඩිය යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගය දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යයයි! අණන්ත අපරිමාන බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේලා අති දීර්ඝ කාලයක් මුළුල්ලේ පුරණ ලද දානාදි පාරමී ධර්මයන්ගේ බලයෙන් මෙම ආයර්‍ය සත්‍ය හතර අවබෝධකරගෙන අජරාමර අමාමහ නිවනට පත්වී වදාළා. අපටත් මේ බුදු සසුනෙහි කරන දාන, සීල, භාවනාදි සියලුම කුසල් පාරමී බවට පත්වේවා! පැතූ අධිගම ඥාණයකින් චතුරායර්‍ය සත්‍ය ධර්මය සුවසේම අවබෝධ වේවායි. ප්‍රාර්ථානා පිහිටුවා ගනිමු.

සීලයක පිහිටා මෙතෙක් වේලා සමාධි ගතව ධර්ම ශ්‍රවණය කිරීමේ කුසලානුභාව බලයෙන් සහ රත්නත්‍රයේ සූවිසි මහා ගුණානුභාව බලයෙන් සැමට මෙලොව වශයෙන් ආයුරාරෝග්‍යාදි සම්පත් මුදුන්පත් වේවා! සකලාන්තරාය සර්වෝපද්‍රවයන් හිරුදුටු අඳුරසේ දුරුවේවා! සෙත ශාන්තිය යහපත සැලසේවා! මෙම බුදු සසුනෙහි සියවස් කලක් උදාර ලෙස පාරමී කුසල් දියුණු කිරීමේ ශක්තිය සැමට ලැබේවා සමාධි

සිතින් සැප නින්දට පත්වේවා.සැපෙන් අවදිවේවා! නපුරු සිහින නොපෙනේවා දෙවියන්ට මනුෂ්‍යයන්ට සෑම සත්වයන්ටම ප්‍රියවේවා! දෙවියන්ගේ දැහැමි ආරක්ෂාව නිරතුරු ලැබේවා. රජ සොර, සතුරු, ගිනි, ජල, අවි, ආයුධාදි, විපත් වැලකේවා ගුණ, නුවණින්, ධන ධාන්‍යයෙන්, යස ඉසුරින්, භව භෝග, සම්පතීන්ගෙනද දාන, සීල, භාවනා, සීල සමාධි, ප්‍රඥා, ආදි උතුම් ගුණ ධර්මයන්ගෙන්ද ජීවිත ආලෝකමත් වේවා.

සසර ගමනේදි පවා පාරමී පුරන පුණ්‍යවන්ත, භාග්‍යවන්ත බෝධි සත්ව ජීවිතම උදාපත් වේවා! සසර වසනතුරු බුද්ධාදි සත්පුරුෂෝත්තමයන්ගේ සංසේවනය ලැබේවා! යෝනිසෝ මනසිකාරය ධර්මානු ධර්ම ප්‍රතිපත්ති පුරාගැනිමේ භාග්‍ය සැලසේවා! ජාතිස් මරණ ඥාණ ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සම්මා දිට්ඨිය ඇති ආනුභාව සම්පන්න ජීවිත ලබමින් පාරමී පුරා මෙලොව ජයගෙන, පරලොව ජයගෙන, සසර ජයගෙන, කෙලෙසුන් ජයගෙන, ආත්මභාවය ජයගෙන, අනන්ත බුදු, පසේබුදු මහ රහතන් වහන්සේලා විසින් නිවී සැනසී පැමිණ වදාලාවූ අජරාමර ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ කරගැනීම පිණිසම හේතුවේවා! වාසනා වේවා! කියා නිවන් ප්‍රාර්ථනා කරමු.

2017.09.07 දිනට අපවත් වී වසරක් පිරෙන අතිගරු පූජනීය නාඋයනේ අරියධම්ම මහා නාහිමිපාණන් වහන්සේට මෙම ධර්මදානමය කුශලය ලොව්තුරා බුදුබව පිණිසම උපනිශ්‍රය වේවා.!

සියළු සත්වයෝ නිදුක් වෙත්වා!
**සාධු! සාධු!! සාධු!!!**

දන් පින් බැරි දේකැයි නො සිතන්නේ
අන් කළ පින් අනුමෝදන් වෙන්නේ
උන් කළ පින් සරි පින් ලැබ ගන්නේ
ඉන් වද සඟ මොක් සැප සාදන්නේ

දන් දීම වැනි පිංකම් කිරීම බැරි වැඩකැයි නොසිතන්න. අනුන් කළාවූ පින් අනුමෝදන් වීමට කිසිත් අපහසුවක් නැත. ඒ අනුන් කළ පිනට සමාන පිනක්ම එසේ අනුමෝදන් වීමෙනුත් ලැබේ. දෙව් සැප හා නිවන ලැබෙන්නේ එසේ කිරීමෙනි.

(ලෝ වැඩ සඟරාවෙනි)